## රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

## කෑගල්ල දිස්ත්‍රික්කය

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ජුනි 28 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 <u>මතය</u>

මාගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරීම් අනුව රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, - මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵල සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>.

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

(අ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ඉදි කිරීම් වෙනුවෙන් ගමනැගුම, විමධ්‍යගත සබරගමුව අරුණාලෝකය, මහනැගුම හා පළාත් සභා යන ව්‍යාපෘතීන් 05 ක් යටතේ සභා අරමුදලට රු. 54,649,503 ක් ලැබී තිබුණි. එයින් කර්මාන්ත ඉදි කිරීම සඳහා දරන ලද වියදම රු. 52,798,125 ක් වූ අතර එම ගණුදෙනු ගිණුම් මඟින් අනාවරණය කර නොතිබුණි.

(ආ) ස්ථාවර වත්කම් ලේඛණයේ ඇතුළත් දේපල විෂයයන් 17 ක අක්කර 07 රූඩ් 12 පර්චස් 10.225 ක වටිනාකම් ගණනය කර ගිණුම් ගත නොකිරීම හේතුවෙන් වත්කම් අඩුවෙන් දක්වා තිබුණි.

1.3.2 නොසැසඳුන පාලන ගිණුම්

ගිණුම් විෂයයන් 05 කට අදාල පාලන ගිණුම් අනුව ශේෂයන්ගේ එකතුව රු. 1,842,898 ක් වූ අතර, උපයෝගී ලේඛන/වාර්තා අනුව ගිණුම් ශේෂයන්ගේ එකතුව රු. 1,265,236 ක් වූයෙන් වෙනස රු. 577,662 ක් විය.

1.3.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු. 26,337,410. ක් වූ ගණුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 1,360,432 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 5,656,642 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) වරිපනම් හා බදු | 2,889 | 3,018 | 129 |
| (ii) බදු කුලී | 9,869 | 9,015 | 854 |
| (iii) බලපත්‍ර ගාස්තු | 388 | 311 | 76 |
| (iv) වෙනත් ආදායම් | 36,351 | 38,679 | 2,328 |

2.2.2 වෙළඳ බලපත්‍ර ගාස්තු

සමාලෝචිත වර්ෂයේ වෙළඳ බලපත්‍ර හා ව්‍යාපාර බදු ආදායම් අය කර ගැනීම සඳහා ක්ෂේත්‍ර සමීක්ෂණ සිදු කර ව්‍යාපාර ආයතන හඳුනාගෙන නොතිබූ අතර ආදායම් ලැබීම් පදනම මත ගිණුම් ගත කර තිබුණි.

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | රු. |
|---|---|
| (i) උසාවි දඩ | 8,223,498 |
| (ii) මුද්දර ගාස්තු | 7,244,850 |

සමාලෝචිත වර්ෂයට අය විය යුතු මුද්දර ගාස්තු ආදායම් ගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

2.3 කොන්ත්‍රාත් පරිපාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රුවන්වැල්ල ක්‍රීඩා පිටිය අසල රථ ගාල සංවර්ධනය කිරීම.

රු. 305,245 ක වැඩ පිරිවැය ඇස්තමේන්තුවක් මත 2012 ජූනි 05 දින බෝපැත්ත ගොවි සංවිධානය සමඟ ගිවිසුමකට එළඹ 2012 ජූලි 14 දින වැඩ නිම කරවා ගෙන තිබුණි. වැඩ ඇස්තමේන්තුවේ හා ගෙවීම් වාර්තාවේ වැඩ විෂය අංක 02 පරිදි බොරළු කියුබ් 55 ක් කි.මී. 10 ක් දුරින් සපයා ප්‍රවාහනය කර මුට්ට කිරීම සඳහා කියුබ් 01 ක් රු. 4,099 ක් බැගින් රු. 225,445 ක් ගෙවා තිබූ නමුත් බොරළු ලබා ගත් ස්ථානය හා ප්‍රවාහනය කර සපයා තිබූ බොරළු ප්‍රමාණය පිළිබඳ විස්තරාත්මක මිණුම් ගොනුවේ දක්වා නොතිබුණි.

(ආ) කසළ ගොඩ ගසන, තෝරන සහ වෙන් කිරීමේ විවෘත හා සංවෘත කොම්පෝස්ට් අංගනය ඉදි කිරීම.

2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 යටතේ වැඩ කොන්ත්‍රාත් ගිවිසුමකදී කොන්ත්‍රාත්කාර ප්‍රජා සංවිධාන වලට සුරක්ෂිතයක් නොමැතිව අත්තිකාරම් ලෙස මුදලින් රු. 200,000 ක උපරිමයක් ගෙවිය යුතු වුවද, මෙම කර්මාන්තය සඳහා රු. 570,000 ක් අත්තිකාරම් ලෙස ගෙවා තිබුණෙන් රු. 370,000 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය

(ආ) වත්කම් කළමනාකරණය